1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/06/ANN.TR/2025(120) | ඔබේ අංකය / உமது இல / Your Ref. | දිනය / திகதி / Date 2025.10.16 |

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් සහ සියලු ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු නියෝග - 2025 සම්බන්ධවයි</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අංක G/SP/3/3/TR/25(iii) හා 2025.10.16 දිනැති ලිපිය හා බැඳේ.

02. උක්ත යොමු ලිපිය මඟින්, 2025 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන් වෙත අභියාචනා ඉදිරිපත් කළ නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අභියාචනා තීරණ පහත අමුණුම් මඟින් මා වෙත ඉදිරිපත් කර ඇති අතර එම තීරණ <u>ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට (www.cs.sp.gov.lk) මුද්‍රා හැර ඇති බව</u> කාරුණිකව දන්වමි.

- ඇමුණුම 01 - සංවර්ධන නිලධාරී සේවයේ දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අභියාචන තීරණ
- ඇමුණුම 02 - කළමනාකරණ සේවා නිලධාරී සේවයේ දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අභියාචන තීරණ

03 ඒ අනුව, යම් ස්ථාන මාරු ගැලපුමකට අදාළ ව දකුණු පළාත් <u>ගරු ආණ්ඩුකාරතුමන් වෙත අභියාචනා ඉදිරිපත් කරන ලද</u> නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන් විසින් නිකුත් කරන ලද අභියාචනා නියෝග අවසානාත්මක වන අතර ඒ අනුව එකී තීරණ පරිදි ස්ථාන මාරු ගැලපුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ආයතන ප්‍රධානීන් විසින් ක්‍රියා කළ යුතුය.

04. එසේම, යම් ස්ථාන මාරු ගැලපුමකට අදාළ ව <u>දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන් වෙත අභියාචනා ඉදිරිපත් කර නොමැති වුව ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කරන ලද</u> නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP-PSC/5/1/2A-3(II) හා 2025.10.03 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති තීරණ අවසානාත්මක තීරණයන් සේ සලකා එම ස්ථාන මාරු ගැලපුම් නියෝග සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කළ යුතුය.

05. එසේම, යම් ස්ථාන මාරු ගැලපුමකට අදාළ ව <u>දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන් වෙත හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතට අභියාචනා කර නොමැති වුද, දකුණු පළාත් ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල වෙත අභියාචනා ඉදිරිපත් කරන ලැබුවා වුද</u> නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් මාගේ තීරණ නිකුත් කරන ලද CSS/03/06/ANN.TR/2025(80) හා 2025.08.26 දිනැති ලිපියේ සඳහන් නියෝග අවසානාත්මක තීරණ සේ සලකා එකී ස්ථාන මාරු ගැලපුම් නියෝග ක්‍රියාත්මක කළ යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | [redacted]ය / காரியாலயம் / Office 091 4119011, 091 2234052 | ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | [redacted] වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

06. ඒ අනුව, ඉහත 03 හා 04 ඡේදයෙන්හි සඳහන් ආකාරයට ක්‍රියාත්මක කළ යුතු යැයි **විශේෂ දිනයක් සඳහන් කර නොමැති වාර්ෂික ස්ථාන මාරු ගැලපුම් 2025.10.21 දින සිට ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ සඳහා එම නිලධාරීන් 2025.10.17 දින සේවයෙන් පසු** වර්තමාන සේවා ස්ථානයේ සේවයෙන් නිදහස් කළ යුතුය.

07. එසේම, ඉහත 03, 04 හා 05 ඡේදයන් යටතේ දක්වා ඇති **ස්ථාන මාරු ගැලපුම්වල ක්‍රියාත්මක විය යුතු යැයි විශේෂ දිනයක් සඳහන් කර ඇති ස්ථාන මාරු පමණක්** අදාළ දිනයේදී ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

08. තව ද, 2025 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් 2025.02.05 දිනැති ව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 හි සඳහන් අනෙකුත් කොන්දේසි ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

**රනිල් වික්‍රමසේකර**
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත.

**අ/කලේ : සුමිත් අලහකෝන්**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**පිටපත්:**

01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය, ගාල්ල. - දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - 2025 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය මා වෙත දැනුම් දීමට
03. ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම් / සම්බන්ධීකරණ ලේකම් - දැ.ගැ.ස.

**එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර**
எம்.கே.பந்துல ஹரிச்சந்திர
M.K.Bandula Harischandra
**දකුණු පළාත් ආණ්ඩුකාරවර**
தென் மாகாண ஆளுநர்
Governor of Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது எண். / My No. } G/SP/3/3/ TR /25/ (iii) | ඔබේ අංකය / உங்கள் எண். / Your No. } | දිනය / தேதி / Date } 2025.10. 16 |

ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථානමාරු නියෝග - 2025 සම්බන්ධවයි.**

උක්ත කරුණ සම්බන්ධව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/3/ TR /25/ (ii) හා 2025.10.14 දිනැති ලිපිය හා බැඳේ.

02) ඒඅනුව , කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු සම්බන්ධව මා වෙත ඉදිරිපත්වූ අභියාචනා පළාතේ අවසානාත්මක අභියාචනා බලධරයා ලෙස මා විසින් සලකා බලා ලබා දී ඇති තීරණ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මේ සමඟ අමුණා යොමු කරමි. ( ඇමුණුම් අංක 01)

03) අදාල ස්ථානමාරු 2025.10.21 දින සිට නව සේවා ස්ථාන වෙත වාර්තා කළ හැකි වන පරිදි , ක්‍රියාත්මක කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර,**
**ආණ්ඩුකාරවර,**
**දකුණු පළාත.**

එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර
ආණ්ඩුකාරවර
දකුණු පළාත

**පිටපත්-**

**1.ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,දකුණු පළාත. - කාරු.දැ.ගැ.ස**